AIA විසින් 2021 වසරේ අලෙවි කරන සෑම ඔප්පුවක් සඳහාම
රු. 100 ක් ශ්‍රී ලංකා පිළිකා සංගමයට පරිත්‍යාග කිරීමට පොරොන්දු වෙයි.

# AIA සුපර් ප්‍රොටෙක්ටර්

## පරිපූර්ණ ජීවිත රක්ෂණ විසඳුමක්



AIA ඉන්ෂුවරන්ස්

HEALTHIER, LONGER, BETTER LIVES

# අප ජීවිතය ලෙස හඳුන්වන මෙම ගමනට විවිධ සන්ධිස්ථාන ඇති අතර අප සෑම කෙනෙකුම එම ගමනේ වෙනස් අවධිවල සිටින්නෙමු.

අපගේ අත්දැකීම්, අපගේ අවශ්‍යතා, අපගේ සිහින හා අභිලාෂයන්, සියල්ල එකිනෙකාට වෙනස්. සමහරු තරුණ වියේ සැහැල්ලුව හා ජීවිතයේ ත්‍රාසජනක අත්දැකීම් බලාපොරොත්තු වේ. තවත් අය ජීවිතය බෙදාහදා ගැනීමට හවුල්කරුවෙකු වෙනුවෙන් කැපවීමට බලා සිටියි. සමහරු පවුලට නව සාමාජිකයෙක් බලාපොරොත්තුවෙන් සිටින අතර තවත් සමහරු ඔවුන්ගේ සිහින විශ්‍රාම දිවියට එළඹීමට නොඉවසිල්ලෙන් බලා සිටියි. අපගේ ජීවිත පොතෙහි අප සිටින පරිච්ඡේදය අනුව අපගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් වෙනස් වේ.

## ජීවිතයේ විවිධ අවධි



නමුත් අප කුමන අවධියක සිටියත්, හැම කෙනෙකුටම වගේ පොදු හා නිරතුරුවම නොවෙනස්ව පවතින එක් දෙයක් තිබෙනවා. ඒ අපේ පවුල. අපට හැකි පමණින් හොඳම දේ ලබා දෙන, වඩාත් ආදරයෙන් රැකබලා ගන්නා අපගේ ආදරණීයයන්. ඒ අප ඔවුන්ව රැකබලා ගනීවි යැයි අපේක්ෂාවෙන් සිටින, අපගේ දෙමව්පියන්, ජීවන සහකරු හෝ සහකාරිය සහ අපේ දරුවන් විය හැකියි.



දියණිය



පුතා



ස්වාමිපුරුෂයා



බිරිඳ



පියා



මව

## නමුත් අප නැති කාලයක අපේ පවුලට කුමක් සිදුවේද? ඔවුන්ව රැකබලා ගන්නේ කවුද?

ඔබ ජීවිතයේ කුමන අවධියක සිටියත්, අනපේක්ෂිත වියෝවීමකදී වුවද ඔබගේ ආදරණීයයන් සුරක්ෂිත විය යුතුය. ඔබ නොමැති විට පවා ඔවුන්ගේ හුරුපුරුදු ජීවන රටාව දිගටම පවත්වාගෙන යාමට ඔවුන් මූල්‍යමය වශයෙන් සුරක්ෂිත විය යුතුය.

# මේ පිළිබඳව ඔබට වෙනත් අදහස් තිබිය හැකියි...




# නමුත් ඔබේ පවුලේ රැකවරණය තහවුරු කිරීම කල් දැමිය යුතු දෙයක් කියා ඔබ ඇත්ත වශයෙන්ම සිතනවා ද?

## ජීවිතය කෙතරම් අස්ථිර විය හැකිදැයි සිතා බලන්න...

ශ්‍රී ලංකාවේ, **දිනකට පුද්ගලයින් 8 දෙනෙකු පමණ** මාර්ග අනතුරු හේතුවෙන් මිය යයි

ගෝලීය වශයෙන්, **සෑම වසරකම මිලියන 1.25 ක් මාර්ග අනතුරු හේතුවෙන් මිය යයි**




Source: www.themorning.lk/safe-roads-and-reducing-accidents/

2020 ජනවාරි සිට ජුනි මාසය දක්වා කාලය තුළ **මෝටර් රථ අනතුරු 8,880** ක් වාර්තා වී ඇත

වැඩිම මරණ සංඛ්‍යාව ලෙස වාර්තා වන්නේ **යතුරුපැදි කරුවන්**

2 වැනියට වැඩිම මරණ සංඛ්‍යාව **පදිකයින්ය**


**ඒ වගේම අමතක කරන්න එපා:**



ශ්‍රී ලංකාවේ මරණ වලින් **75%** ක්ම සිදුවන්නේ **බෝ නොවන රෝග** නිසා බව



ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වලින් සිදුවන මරණ වලින් **35%** ක්ම සිදුවන්නේ **හෘද රෝග** නිසා බව



මරණ සඳහා **ප්‍රධානතම හේතු 20 න් 15 ක්ම** සිදුවන්නේ රෝග වලින් බව




**රෝහල් ගාස්තු වියදම්** ඉහළ යමින් පවතින බව

# AIA සුපර් ප්‍රොටෙක්ටර්

## ඔබ සහ ඔබට වඩාත්ම වැදගත් වන ඔබේම ආදරණීයයන් සුරක්ෂිත කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති පරිපූර්ණ ජීවිත රක්ෂණ සැලසුමක්.

AIA සුපර් ප්‍රොටෙක්ටර් යනු දැරිය හැකි වාරික සහිතව ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි පරිපූර්ණ ජීවිත රක්ෂණ විසඳුමකි. AIA සුපර් ප්‍රොටෙක්ටර් සමග අමතර ප්‍රතිලාභ 6ක් ඔබට තෝරාගත හැකි අතර එමගින් ඔබේ පුද්ගලික අවශ්‍යතා සහ අපේක්ෂාවන් අනුව ඔබට අවශ්‍ය රැකවරණය සැලසුම් කල හැකියි. ඔබ ජීවිතයේ කුමන අවධියක සිටියත් අපි ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට හොඳම මූල්‍ය රැකවරණය ලබා දෙන්නෙමු.

### AIA සුපර් ප්‍රොටෙක්ටර් මඟින් ලැබෙන ප්‍රතිලාභ



5%

## ඔබ දැන සිටියාද?

**නිරන්තරයෙන් වෙනස්වන ඔබගේ ජීවන රටාව, ආදායම් මට්ටම සහ වියදම් සමඟ ගැලපෙන අයුරින් ඔබේ ජීවිත ප්‍රතිලාභය සෑම වසරකම 5% කින් වැඩි වන බව**

# වැඩි වන ජීවිත ප්‍රතිලාභය



ඔබ වියෝවුවහොත් ඔබගේ ප්‍රතිලාභීන්හට ජීවිත ප්‍රතිලාභය ලැබෙනු ඇත.

රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තුරු හෝ ජීවිත ප්‍රතිලාභ හිමිකම් පෑමක් කරන තෙක්, සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනමක් මත ජීවිත ප්‍රතිලාභය 5% කින් ඉහළ යයි.

**රු. මිලියන 1 ත් රු. මිලියන 500 ත් අතර ජීවිත ප්‍රතිලාභ වටිනාකමක් තෝරාගැනීමේ හැකියාව.**

## උදාහරණය: වැඩි වන ජීවිත ප්‍රතිලාභය



ජීවිත රක්ෂිතයාගේ වයස - **අවුරුදු 35**


ජීවිත ප්‍රතිලාභය - **රු. මිලියන 20**

රක්ෂණ ඔප්පු කාල සීමාව - **අවුරුදු 20**

### 11 වන වසරේදී වියෝවීමක් සිදුවුවහොත්

**වැඩි වූ ජීවිත ප්‍රතිලාභය**

ජීවිත ප්‍රතිලාභය වන රු. මිලියන 20, වාර්ෂිකව 5% කින් (රු. මිලියන 1 කින්) වැඩි වන අතර 11 වන වසර වන විට ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 30ක් වනු ඇත



# අමතර ප්‍රතිලාභ



## ඔබ කවදා හෝ කල්පනා කර තිබේද?

**හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් අවාසනාවන්ත වියෝවීමකට හෝ නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට (Totally Permanently Disabled) පත් වුවහොත්, ඔබගේ පවුලේ මූල්‍ය අවශ්‍යතා සපුරාලන්නේ කවුරුන්ද කියා?**




## පවුල් ආදායම් ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ඔබ අවාසනාවන්ත වියෝවීමකට හෝ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට (Totally Permanently Disabled) පත් වුවහොත්, ඔබේ ප්‍රතිලාභීන්ට ඉදිරි වසර 5 සඳහා ‘මාසික ආදායමක්’ ලැබෙනු ඇත.

රු. 10,000 සිට ඉහළට ඔබේ පවුලට අවශ්‍ය මාසික ආදායම ඔබට තෝරාගත හැකිය.

**ඔබේ රක්ෂණ ඔප්පුව ආරම්භයේ දී ඇති පවුල් ආදායම් ප්‍රතිලාභ වටිනාකම, මෙම ප්‍රතිලාභයේ හිමිකම් පෑමක් සිදු කරන තෙක්, සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනම මත 5% කින් ඉහළ යනු ඇත.**



# පවුල් ආදායම් ප්‍රතිලාභය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ උදාහරණයක්:




- ජීවිත රක්ෂිතයාගේ වයස - අවුරුදු 35
- පවුල් ආදායම් ප්‍රතිලාභ වටිනාකම - මාසිකව රු. 200,000
- ජීවිත ප්‍රතිලාභය - රු. මිලියන 20
- රක්ෂණ ඔප්පු කාල සීමාව - අවුරුදු 20

## 11 වන වසරේදී වියෝවීමක් සිදුවුවහොත්

**වැඩි වූ පවුල් ආදායම් ප්‍රතිලාභය**

රු. 200,000 වාර්ෂිකව 5% කින් (රු. 10,000 කින්) වැඩි වන අතර 11 වන වසරේදී පවුල් ආදායම් ප්‍රතිලාභය රු. 300,000ක් වනු ඇත.




**2** ඉදිරි වසර 5 සඳහා රු. 300,000ක් මාසිකව ගෙවනු ලැබේ

**ජීවිත ප්‍රතිලාභයට (රු. මිලියන 30) අමතරව**

රු. මිලියන 20 වාර්ෂිකව 5% කින් (රු. මිලියන 1 කින්) වැඩි වන අතර 11 වන වසරරේදී ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 30ක් වනු ඇත

**1** **රු. මිලියන 30ක ජීවිත ප්‍රතිලාභය** ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ

## ඔබ දැන සිටියාද?

**AIA සුපර් ප්‍රොටෙක්ටර් ඔබේ රැකවරණ අවශ්‍යතා සපුරනවා පමණක් නොව, රක්ෂණ ඔප්පු කාලසීමාව අවසානයේදී ගෙවන ලද සියලුම වාරික නැවත ලබා ගැනීමට ඔබට ඉඩ සලසන බව?**

**ඔබ AIA සුපර් ප්‍රොටෙක්ටර් මිලදී ගන්නා විට 'වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය' අමතර ප්‍රතිලාභයක් ලෙස ලබා ගත හැකි බව.**

### නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවය - ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, ඔබ තෝරාගත් නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.

නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවය - ඔබ හදිසි අනතුරක් හේතුවෙන් නිත්‍ය අර්ධ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, ඔබේ රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ වගුවේ සදහන් කර ඇති ආකාරයට එකී ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.

### 37 අසාධ්‍ය රෝග ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ලැයිස්තුගත කර ඇති අසාධ්‍ය රෝග හා ශල්‍ය කර්ම 37න් එක් රෝගයක් වැළඳුනහොත් හෝ ඉන් එක් ශල්‍ය කර්මයකට බඳුන් වුවහොත්, මෙම ප්‍රතිලාභ මුදල ඔබට ගෙවනු ලැබේ.

### වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ඔබ රක්ෂණ ඔප්පු කාල සීමාව තුල අවාසනාවන්ත වියෝවීමකට පත් නොවුවහොත් AIA විසින් ඔබ ගෙවූ වාරික සියල්ල රක්ෂණ ඔප්පු කාලසීමාව අවසානයේදී ඔබට ආපසු ලබා දෙනු ඇත.

රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ ඔබ ජීවිත ප්‍රතිලාභය හැර වෙනත් ඕනෑම හිමිකම් පෑමක් සිදු කර තිබුණද මෙම ප්‍රතිලාභය ඔබට ගෙවනු ලැබේ.

### වාරික ආරක්ෂණ ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තෙක් ඔබගේ රැකවරණය තහවුරු කරමින් AIA විසින් ඔබ වෙනුවෙන් වාරික ගෙවනු ඇත.

### හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (අමතර ප්‍රතිලාභ)

හදිසි අනතුරක් හේතුවෙන් අවාසනාවන්ත ලෙස වියෝවුවහොත්, ප්‍රතිලාභීන්ට ජීවිත ප්‍රතිලාභයට අමතරව හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ මුදල ද ලැබෙනු ඇත.

# AIA සුපර් ප්‍රොටෙක්ටර් ප්‍රතිලාභ ලබාදෙන්නේ කෙසේද?

**තරිඳුගේ වයස (ඔහුගේ ඊළඟ උපන්දිනය වන විට) අවුරුදු 35 කි. විවාහකයෙක් වන ඔහු බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ ජීවිතය උපරිමයෙන් විඳිමින් ගත කරයි.**

ඔහු 'වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය' ඇතුලුව පහත ප්‍රතිලාභ සමඟ AIA සුපර් ප්‍රොටෙක්ටර් මිලදී ගෙන ඇත.

# උදාහරණය: 'වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය' සමග



වයස: **35**

රක්ෂණ ඔප්පු කාල සීමාව: **25**

ජීවිත ප්‍රතිලාභය: **රු. මිලියන 5**

\+

## තෝරාගත් අමතර ප්‍රතිලාභ

- වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය
- නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය **රු. මිලියන 5**
- වාරික ආරක්ෂණ ප්‍රතිලාභය
- හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය **රු. මිලියන 5**
- පවුල් ආදායම් ප්‍රතිලාභය **මාසිකව රු. 50,000**


වාර්ෂික වාරිකය **රු. 112,814**

## රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ AIA සුපර් ප්‍රොටෙක්ටර් තරිඳුට සහ ඔහුගේ පවුලට උපකාරී වී ඇති අයුරු

**තරිඳු 11 වන වසරේ දී නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වුවහොත්, පහත ආකාරයට AIA සුපර් ප්‍රොටෙක්ටර් වෙතින් ඔහුට ප්‍රතිලාභ හිමිවනු ඇත.**

### වැඩි වූ පවුල් ආදායම් ප්‍රතිලාභය

රු. 50,000 වාර්ෂිකව 5% කින් (රු. 2,500 කින්) ඉහළ යන අතර 11 වන වසරේදී පවුල් ආදායම් ප්‍රතිලාභය රු. 75,000 ක් වනු ඇත




**2** ඉදිරි වසර 5 සඳහා රු. 75,000ක් මාසිකව ගෙවනු ලැබේ

නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභයට (රු. මිලියන 5) අමතරව

**1** නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය වන රු. මිලියන 5 තරිඳුට වහාම ගෙවනු ලැබේ

**3** රක්ෂණ ඔප්පුවේ ඉතිරි කාලසීමාව සඳහා AIA විසින් තරිඳු වෙනුවෙන් වාරික ගෙවනු ඇත

**4** තරිඳු සහ AIA විසින් ගෙවූ සියලුම වාරික, තරිඳුට ආපසු ලබා දෙනු ඇත

**රු. 2,820,350** (රු. 112,814 x 25)

**'වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය' නොමැතිව සහ පහත අමතර ප්‍රතිලාභ සමඟ තරිඳු විසින් AIA සුපර් ප්‍රොටෙක්ටර් මිලදී ගත්තේ නම්;**

# උදාහරණය: 'වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය' නොමැතිව



වයස: **35**

රක්ෂණ ඔප්පු කාල සීමාව: **20**

ජීවිත ප්‍රතිලාභය: **රු. මිලියන 5**

+

**තෝරාගත් අමතර ප්‍රතිලාභ**

- වාරික ආරක්ෂණ ප්‍රතිලාභය
- නිත්‍ය පූර්ණ අකර්මන්‍යතා ප්‍රතිලාභය **රු. මිලියන 5**
- 37 අසාධ්‍ය රෝග ප්‍රතිලාභය **රු. මිලියන 2**
- හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය **රු. මිලියන 5**
- පවුල් ආදායම් ප්‍රතිලාභය **මාසිකව රු. 50,000**


වාර්ෂික වාරිකය **රු. 61,526**

**රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ AIA සුපර් ප්‍රොටෙක්ටර් තරිඳුට සහ ඔහුගේ පවුලට උපකාරී වී ඇති අයුරු**

**3 වන වසරේ දී තරිඳුට අසාධ්‍ය රෝගයක් වැළඳුනහොත් සහ 11 වන වසරේදී ඔහු වියෝවුවහොත්**


**වැඩි වූ පවුල් ආදායම් ප්‍රතිලාභය**

රු. 50,000 වාර්ෂිකව 5% කින් (රු. 2,500 කින්) ඉහළ යන අතර 11 වන වසරේදී පවුල් ආදායම් ප්‍රතිලාභය රු. 75,000ක් වනු ඇත






**3** ඉදිරි වසර 5 සඳහා රු. 75,000 ක් මාසිකව ගෙවනු ලැබේ ජීවිත ප්‍රතිලාභයට (රු. මිලියන 7.5) අමතරව







**1** මිලියන 2 ක අසාධ්‍ය රෝග ප්‍රතිලාභය තරිඳුට ගෙවනු ලැබේ



**2** ජීවිත ප්‍රතිලාභය වන රු. මිලියන 7.5ක් ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ

**වැඩි වූ ජීවිත ප්‍රතිලාභය**

රු. මිලියන 5 වාර්ෂිකව 5% කින් (රු. 250,000 කින්) වැඩි වන අතර 11 වන වසර වන විට ජීවිත ප්‍රතිලාභය රු. මිලියන 7.5ක් වනු ඇත



# අනෙකුත් වැදගත් තොරතුරු

| රක්ෂණ ඔප්පු කාල සීමාව/වාරික ගෙවීමේ කාල සීමාව | වසර 10 | වසර 15 | වසර 20 | වසර 25 | වසර 30 |
|---|---|---|---|---|---|

| වාරික ගෙවීමේ මාදිලිය | වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව, කාර්තුමය, මාසිකව |
|---|---|

| ඇතුළත් වීමේ දී වයස සහ ආවරණය අවසන් වීමේදී වයස | | අවම ඇතුළත් වීමේ වයස (ඊළඟ උපන්දිනය වන විට) | උපරිම ඇතුළත් වීමේ වයස (ඊළඟ උපන්දිනය වන විට) | ආවරණ අවසන් වීමේ වයස |
|---|---|---|---|---|
| | ජීවිත ප්‍රතිලාභය | වසර 19 | වසර 66 | වසර 75 |
| | අමතර ප්‍රතිලාභ | වසර 19 | වසර 66 | වසර 75 |

| වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය | මෙම ප්‍රතිලාභය ලබා ගත හැක්කේ ඔබ ඔප්පු කාලසීමාව ලෙස අවුරුදු 25 හෝ අවුරුදු 30 තෝරා ගෙන ඇත්නම් පමණි |
|---|---|

# නිතර අසන ප්‍රශ්න

## 1. AIA සුපර් ප්‍රොටෙක්ටර් යනු කුමක්ද?

AIA සුපර් ප්‍රොටෙක්ටර් යනු දැරිය හැකි වාරික සහිතව ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි පරිපූර්ණ ජීවිත රක්ෂණ විසඳුමකි. ඔබට වඩාත් පරිපූර්ණ ආවරණයක් සහිත විසඳුමක් ලබා දීම සඳහා මෙයට අමතර ප්‍රතිලාභ ඇතුළත් වේ.

## 2. AIA සුපර් ප්‍රොටෙක්ටර් මා ආවරණය කරන්නේ කුමකින් ද?

AIA සුපර් ප්‍රොටෙක්ටර් යනු ඔබේ අවශ්‍යතාවයට අනුව තෝරා ගත හැකි අමතර ප්‍රතිලාභ හයකින් සමන්විත රක්ෂණ සැලසුමකි. එමගින් ඔබේ පුද්ගලික අවශ්‍යතා සහ අපේක්ෂාවන් අනුව ඔබට අවශ්‍ය රැකවරණය සැලසුම් කල හැකියි. අමතර ප්‍රතිලාභ 6 පහත පරිදි වේ;

ආ) හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය

ආ) නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය

ඇ) පවුල් ආදායම් ප්‍රතිලාභය

ඈ) 37 අසාධ්‍ය රෝග ප්‍රතිලාභය

ඉ) වාරික ආරක්ෂණ ප්‍රතිලාභය

ඊ) වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය

## 3. මට දැනටමත් ඉතිරි කිරීම් තිබේ - මට මෙය අවශ්‍ය වන්නේ ඇයි?

අප අවට පරිසරය අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපේ ජීවිත කාලය තුළ බොහෝ අනපේක්ෂිත තත්ත්වයන් ඇතිවිය හැකිය. යම් රෝගයකට හෝ අනතුරකට මුහුණ පෑමට සිදුවුවහොත්, ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට ප්‍රමාණවත් මූල්‍ය රැකවරණයක් අවශ්‍ය වනු ඇත. ජීවිත රක්ෂණ සැලසුමක් නොමැති අවස්ථාවක, ඔබ මහන්සියෙන් උපයාගෙන ඉතිරි කරගත් ධනය ඒ සඳහා භාවිතා කිරීමට සිදුවනු ඇත. එබැවින් ඔබේ රැකවරණ අවශ්‍යතා අනුව ඔබටම සරිලන පරිදි ලබා ගත හැකි රක්ෂණ විසඳුමක් හිමි කර ගැනීම අප ඕනෑම කෙනෙකුට අත්‍යවශ්‍ය වේ. AIA සුපර් ප්‍රොටෙක්ටර් යනු ශ්‍රී ලංකාවේ ඇති හොඳම ජීවිත රක්ෂණ සැලසුමක් වන අතර ඔබට වඩාත් අවශ්‍ය අවස්ථාවලදී ඔබ සහ ඔබේ පවුලේ අය මූල්‍යමය වශයෙන් සුරක්ෂිත කිරීමට එය සමත් වේ.

### 4. ජීවිත රක්ෂණ ප්‍රතිලාභය සමඟ හදිසි අනතුරු මරණ ප්‍රතිලාභයක් ලබා ගත හැකිද?

ඔව්. ඔබේ රක්ෂණ ඔප්පුවට හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය එක් කළ හැකිය. හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන අවාසනාවන්ත මරණයක දී, ඔබේ ප්‍රතිලාභීන්ට ජීවිත ප්‍රතිලාභයට අමතරව හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ මුදල ද ලැබෙනු ඇත.

### 5. ජීවිත ප්‍රතිලාභයේ 5% ක වැඩිවීම රක්ෂණ ඔප්පු කාලය අවසන් වන තෙක් පවතින්නේද?

සෑම රක්ෂණ ඔප්පු සංවත්සරයකදීම සරල රේඛීය පදනමක් මත ජීවිත ප්‍රතිලාභය 5% කින් වැඩි වීම රක්ෂණ ඔප්පු කාල සීමාව අවසන් වන තෙක් හෝ ජීවිත ප්‍රතිලාභයේ හිමිකම් පෑමක් සිදු වන තෙක් පවතිනු ඇත. අවාසනාවන්ත වියෝවීමකදී වැඩි වූ ජීවිත ප්‍රතිලාභ මුදලම ඔබේ ප්‍රතිලාභීන්ට වහාම ගෙවනු ලැබේ.

### 6. නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය ඉල්ලා සිටිය හැක්කේ කවර තත්ත්වයන් යටතේ ද?

ඔබ හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුවහොත්, තෝරාගත් ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත. කෙසේ වෙතත්, නිත්‍ය අර්ධ අකර්මන්‍යතා ප්‍රතිලාභය ගෙවනු ලබන්නේ එම අකර්මන්‍යතාවය හදිසි අනතුරක් හේතුවෙන් සිදු වූ විට පමණි. ඔබේ රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ වගුවේ සඳහන් කර ඇති ආකාරයට එකී ප්‍රතිලාභ මුදල ඔබට ලැබෙනු ඇත.

### 7. මම අධ්‍යාපන කටයුතු හෝ රැකියාවක් සඳහා විදේශගත වීමට අදහස් කරන්නේ නම්, AIA සුපර් ප්‍රොටෙක්ටර් සැලසුමක් ලබාගෙන විදේශගතව සිටියදී පැන නගින ඕනෑම අවශ්‍යතාවක් සඳහා එහි ප්‍රතිලාභ හිමිකම් පෑමක් කළ හැකිද?

ඔව්, ඔබ රක්ෂණ ඔප්පුව මිලදී ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකු නම් ඔබට රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැකිය. කෙසේ වෙතත්, මෙම රක්ෂණ ඔප්පුවට අදාළ ප්‍රතිලාභ ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවනු ලබන අතර දීර්ඝ කාලයක් රටින් පිටත සංචාරය කිරීම සඳහා වූ තම අභිප්‍රාය ජීවිත රක්ෂිතයා විසින් එම සංචාරයට පෙර සමාගම වෙත හෙළි කළ යුතුය.

### 8. රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ මා හදිසි වියෝවීමකට පත්වුවහොත් කුමක් සිදුවේද?

අ) ඔබගේ ප්‍රතිලාභීන්ට වැඩි වූ ජීවිත ප්‍රතිලාභ වටිනාකම වහාම ලැබෙනු ඇත.

ආ) ඔබ පවුල් ආදායම් ප්‍රතිලාභය තෝරාගෙන තිබේ නම්, ප්‍රතිලාභීන්ට ඉදිරි වසර 5 සඳහා වැඩි වූ 'පවුල් ආදායම් ප්‍රතිලාභය' ලැබෙනු ඇත.

### 9. පවුල් ආදායම් ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය තෝරාගෙන තිබූ අවස්ථාවක මා හදිසි ලෙස නිත්‍ය පූර්ණ අකර්මන්‍යතාවයකට පත් වුයේ නම් කුමක් සිදුවේද?

අ) නිත්‍ය අකර්මන්‍යතා ප්‍රතිලාභය ඔබ වෙත වහාම ගෙවනු ලැබේ.

ආ) ඔබට ඉදිරි වසර 5 සඳහා වැඩි වූ 'පවුල් ආදායම් ප්‍රතිලාභය' මාසිකව ලැබෙනු ඇත.

ඇ) රක්ෂණ ඔප්පුවේ ඉතිරි කාලය සඳහා ඔබ වෙනුවෙන් AIA විසින් වාරික ගෙවනු ලබන අතර ඔබ විසින් වාරික ආපසු ගෙවීමේ ප්‍රතිලාභය තෝරාගෙන තිබේ නම් සහ ඔබ වියෝවීමකට පත් නොවුවහොත්, රක්ෂණ ඔප්පු කාල සීමාව අවසානයේ දී ගෙවූ සියලු වාරික ඔබට ආපසු ලබා දෙනු ලැබේ.

### 10. AIA සුපර් ප්‍රොටෙක්ටර් සමඟ හිමිකම් පෑමක් සඳහා මට පොරොත්තු කාලයක් තිබේද?

රක්ෂණ ඔප්පුව ආරම්භයේ සිටම (හෝ නැවත සක්‍රීය කිරීමේ සිටම) ජීවිත හා හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ වහාම ක්‍රියාත්මක වේ. ඔබගේ AIA සුපර් ප්‍රොටෙක්ටර් රක්ෂණ ඔප්පුවට ඔබ එකතු කළ අමතර ප්‍රතිලාභ සඳහා පොරොත්තු කාල සීමාවන් තිබේ. නිදසුනක් ලෙස, අසාධ්‍ය රෝග ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමක් සඳහා රක්ෂණ ඔප්පුව ආරම්භයේ සිට (හෝ නැවත සක්‍රීය කිරීමෙන් පසු) දින 90 ක පොරොත්තු කාලයක් තිබේ.

### 11. මම AIA සුපර් ප්‍රොටෙක්ටර් රක්ෂණ ඔප්පුවක් මිලදී ගන්නේ කෙසේද?

ඔබට මේ සඳහා AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු, AIA මූල්‍ය සැලසුම් විධායකවරයෙකු, බලයලත් තැරැව්කරුවෙකු ඇමතීමට හෝ 0112 310 310 හරහා අප ඇමතීමට හැකිය.

## නියමයන් සහ කොන්දේසි

මෙම සැලසුම ලබා ගත හැක්කේ AIA වෙල්ත් ප්ලෑනර්වරයෙකු, AIA මූල්‍ය සැලසුම් විධායකවරයෙකු හෝ බලයලත් තැරැව්කරුවෙකුගෙන් පමණි.

ඕනෑම රක්ෂණ සමාගමක් සහ / හෝ ඕනෑම රක්ෂණ සැලසුමක් තෝරා ගැනීමේ අයිතිය ඔබ සතු වේ. තවද බැංකුවක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් විසින් තම මූල්‍ය සේවාවන් තුල අන්තර්ගත කර ඇති හෝ බැඳී ඇති ඕනෑම රක්ෂණ සැලසුමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ඔබ සතුවේ. මෙය සැලසුමේ දළ විශ්ලේෂණයක් පමණි. නියමයන් සහ කොන්දේසි අදාළ වේ.

සම්පූර්ණ සැලසුමේ විස්තර, නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න. ඔබේ යෝජනා පත්‍රයට අත්සන් කිරීමට පෙර ඔබට විකුණුම් නිදර්ශනයක් - මිල කැඳවුමක් ලබා දෙනු ඇති අතර එමඟින් සැලසුමේ විශේෂාංග සහ ආවරණයන් තවදුරටත් විස්තර කෙරේ.

SP - 300000396
V2 - 07/21

AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 07/11/2021

HEALTHIER, LONGER, BETTER LIVES